**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකවන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතිය - 2021**

---

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකවන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ (IV) ව්‍යවස්ථාවේ 04.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, ප්‍රවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. ප්‍රමුඛ ප්‍රවාහන ව්‍යාපෘතියේ සූදානම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කිරීම සඳහා උපදේශන සේවා සැපයීම යන එක් සංරචයක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,654.54කට සමාන එ.ජ.ඩො මිලියන 11.36ක් වන අතර ඉන් රු.මිලියන 1,456.50කට සමාන එ.ජ.ඩො. මිලියන 9.99ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 198.04ක් ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීමට නිවාස ඒකක ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ යටතට නොතිබුණද කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීමේ | නිවාස ඒකක 1,244න් නිවාස ඒකක 694ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් මිළදී ගෙන ඇත. ඉතිරි නිවාස ඒකක 550 ප්‍රමාද වී තිබුණි.<br>• රජයේ තීරණයට අනුව අවබෝධතා | කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අනුව ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව නිමකළ යුතුය. |

අරමුණින් නිවාස ඒකක 1,244ක් ඉදිකිරීමට ව්‍යාපෘති කාර්යාලය සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර අවබෝධතා ගිවිසුම් 6ක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දින නිම කිරීමට අපේක්ෂිතය. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කිරීමේ අරමුණින් නිවාස ඒකක 484ක් පමණක් වෙන්කර තිබුණි. එමනිසා ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී මෙම ව්‍යාපෘතියේ සංරචකය අත්කර ගැනීමට නොහැකිවේ.

ගිවිසුමට පටහැනිව නිවාස ඒකක 144ක් කොළඹ විශ්ව විද්‍යාලය වෙත වෙන්කර තිබුණි.

- අවශ්‍ය ගෙවීම් සිදුකිරීමට මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබී නොතිබුණි.

(ආ) ඉදිරි වර්ෂ 20 සදහා ජාතික ප්‍රවාහන පද්ධතියට එහි දායකත්වය තහවුරු කිරීමට කොළඹ තදාසන්න ප්‍රදේශයේ දුම්රිය ජාලය සංවර්ධනය කිරීම කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ප්‍රධාන අරමුණ විය. දුම්රිය මාර්ග 4ක් සදහා ශක්‍යතා අධ්‍යන සහ විස්තරාත්මක සැලසුම්කරණය සිදුකිරීම ව්‍යාපෘතියට ඇතුළත් වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතිය 2021 මාර්තු නිමකර තිබුණු අතර ශක්‍යතා අධ්‍යන සහ විස්තරාත්මක සැලසුම් වාර්තා රේඛීය අමාතයංශය වෙත භාරදී තිබුණි. පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශක්‍යතා අධ්‍යන වාර්තාව වසරකට වැඩි කාලයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිශ්කාර්යව පැවතුණි. මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) ණය වාරිකය අර්ධ වාර්ෂිකව මාර්තු 15 සහ සැප්තැම්බර් 15 දින ගෙවිය යුතුය. පළමු ණය වාරිකය වන එ.ජ.ඩො 275,000ක් 2022 මාර්තු 15 දින ගෙවන ලදි.

(iii) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ගාස්තු ලෙස ණය පොළී සදහා රු. 69,345,336 කට සමාන එ.ජ.ඩො 380,000ක් ගෙවා තිබුණි.

2021 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව දැනටමත් රු.මිලියන 1,506කට සමාන එ.ජ.ඩො මිලියන 8.397ක් ප්‍රතිලබ්ධි කර ඇත. ඉන් සියයට 96ක් වන රු.මිලියන 1,447 මුදලක්

2021.06.10 දින ගරු අගමැතිතුමා විසින් මුලසුන දරනු ලැබූ රැස්වීමකදී මෙය තවදුරටත් සාකච්ඡා කරන ලදි. රැස්වීමේදී ගන්නා ලද තීරණවලට අනුව කැළණිවැලි දුම්රිය මාර්ග සංවර්ධනය සදහා ව්‍යාපෘතියක් සකස් කිරීමට අවශ්‍ය පිළියෙල කිරීමේ කටයුතු කරගෙන යාමට සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අරමුදල් ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව සමග සාකච්ඡා කිරීමට ප්‍රවාහන අමාත්‍යාශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

කඩිනමින් කැළණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධනය සදහා ව්‍යාපෘතියක් සකස් කළ යුතුය.

ශක්‍යතා අධ්‍යයන සහ විස්තරාත්මක සැලසුම් සඳහා උපදේශන සේවා ලෙස ගෙවා තිබුණි. ශක්‍යතා අධ්‍යයන සහ විස්තරාත්මක සැලසුම් වාර්තා ක්‍රියාත්මක කිරීමකින් තොරව දුම්රිය දෙපාර්තමේන්තුවේ නිශ්කාර්යව පැවතුණි. එමනිසා මෙම ශක්‍යතා අධ්‍යයන සහ විස්තරාත්මක සැලසුම් වාර්තා ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රටට ප්‍රතිඵලයක් නොලැබෙනු ඇත.

## 2.2 මතභේදයට තුඩුදෙන ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| නැවත පදිංචි කිරීමේ කටයුතු, සුහුරු ප්‍රවේශපත්‍ර සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය මූලික වශයෙන් ව්‍යාපෘතියේ අරමුණු යටතට නොගැනුනද එම අරමුණු කලින් කලට අමාත්‍ය මණ්ඩල තීරණ මගින් ව්‍යාපෘතියට එකතු වී තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br>I. සුහුරු ප්‍රවේශපත්‍ර සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය සඳහා උපදේශන සේවාව සැපයීමට තනි පුද්ගල උපදේශකවරයෙකු වෙත ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල්වලින් එකතුව රු. මිලියන 19.21ක් ගෙවා තිබුණි.<br>II. නැවත පදිංචි කිරීමේ සැලැස්මක් සකස් කිරීමට සහ සමාජ සමීක්ෂණයක් සිදුකිරීමට UN-Habitat වෙත දේශීය අරමුදල්වලින් දැනටමත් එකතුව රු.මිලියන 150.60ක් ගෙවා ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 20.08ක් ගෙවිය යුතුය.<br>III. වෙනත් ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදලක් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක විෂය පථය තුළ පවතින දුම්රිය මාර්ගවල | ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කාලය වැයවන සහ ඉහළ පිරිවැය සහිත කටයුත්තක් වේ. කෙසේවෙතත්, සුහුරු ප්‍රවේශපත්‍ර සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය ඇතුළුව දුම්රිය දෙපාර්තමේන්තුවේ වර්තමාන මෙහෙයුම්වල සංකීර්ණ අවස්ථා සහ තවත් බොහෝ කටයුතු හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ විය. | ව්‍යාපෘතියේ කටයුතුවල විෂය පථය සමාලෝචනය කළ යුතු අතර ඒ අනුව කටයුතු සිදුකළ යුතුය. |

කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් විදේශ උපදේශකවරයෙකු වෙත රු.මිලියන 2.89ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ විෂය පථය තුළට නොවැටෙන එම වියදම සඳහා ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව විගණනය වෙත හෙළිදරව් කර නොතිබුණි.

## 2.3 පද්ධති හා පාලනයන්

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ඇස්තමේන්තුගත පිරිවැය ඒ.ජ.ඩො 500,000 වේ. කෙසේවෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කාලපරිච්ඡේදය සඳහා ඒ.ජ.ඩො 665,351ක් වැයකර තිබුණු අතර එය රු.මිලියන 30.8කට සමාන ඒ.ජ.ඩො 165,351කින් ඇස්තමේන්තුව වන ඒ.ජ.ඩො 500,000 ඉක්මවා තිබුණි. | විගණන පරීක්ෂණය පිළිගන්නා අතර දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අවශ්‍ය අරමුදල් සපුරාලීම සඳහා දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පසුගාමී මූල්‍යන පහසුකමක් (retroactive finance) අනුමත කර තිබුණි. සමහර පරිපාලන කටයුතු ඉතිරිව ඇති බැවින් පසුගාමී මූල්‍යන පහසුකම භාවිත කළ නොහැකි වේ. | අයවැය ප්‍රතිපාදන තුළ වියදම් සිදුකළ යුතුය. |